www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරට එල්ටීටීඊ ප්‍රහාරයක්

## LTTE attack on Sri Lankan air force base

**සරත් කුමාර විසිනි**
**2007 ඔක්තෝබර් 25**

සඳුදා, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය, කොලඹට කිලෝ මීටර් 210ක් උතුරෙන් වූ අනුරාධපුරයේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන කඳවුරකට දැවන්ත ප්‍රහාරයක් එල්ල කලේ ය. ප්‍රහාරයෙන් අඩු ගනනේ මිලිටරි භටයන් 13ක් ද මරාගෙන මැරෙන කොමාන්ඩෝ භට කන්ඩායමක සාමාජිකයන් යැයි විශ්වාස කරනු ලබන එල්ටීටීඊ සටන්කරුවන් 21ක් ද මරුමුවට පත් වූ අතර ගුවන් යානා හා හෙලිකොප්ටර් ගනනාවක් විනාශයට හෝ හානියට ලක් විය.

මෙම ප්‍රහාරය, ආන්ඩුව විසින් 2002 සටන් විරාමය යලි යලිත් උල්ලංඝනය කිරීමට ප්‍රතිචාර ලෙස පසුගිය වසර මුලුල්ලේ එල්ටීටීඊය විසින් සිදු කරනු ලැබූ ආක්‍රමනික මෙහෙයුම් කිහිපයෙන් එකකි. පසුගිය වසරේ ජුලි මස සිට මිලිටරිය දිවයිනේ නැගෙනහිර පලාතේ තිබූ ඔවුන්ගේ ප්‍රධාන ආරක්ෂක ප්‍රදේශවලින් එල්ටීටීඊය පලවා හැර තිබෙන අතර මෑත දී උතුරේ එල්ටීටීඊ බල මධ්‍යස්ථානවලට එරෙහිව ශක්තිය උරගා බැලීමේ මෙහෙයුම් අරඹා ඇත.

ආන්ඩුව සහ මිලිටරිය සඳුදා ප්‍රහාරයෙන් පැහැදිලිව ම විශ්මයට පත් විය. එල්ටීටීඊ කේඩර අලුයම 3.20ට පමන දැඩි මුරකාවල් සහිත කඳවුර තුලට විනිවිඳ එහි මුර පොලවල් හා ගුවන් යානා නාශක තුවක්කු පිහිටි ස්ථාන සිය අනසක යටතට ගෙන ඉන් පසුව ගුවන් යානා ගනනාවක් විනාශ කලහ. ඉන් පැයකට පමන පසුව එල්ටීටීඊයේ සැහැල්ලු ගුවන් යානා දෙකකින් කඳවුරට ගුවනින් බෝම්බ දමන ලදි. කඳවුර තථ්‍ය වසයෙන් ම පැය ගනනාවක් තිස්සේ එල්ටීටීඊ පාලනය යටතේ පැවතුනි

මෙම පුහුනු හා සේවා කඳවුර, ආන්ඩුවේ පාලනය යටතේ පවතින භූමි ප්‍රදේශය තුල බෙහෙවින් අභ්‍යන්තරයට වන්නට, අගනුවර සිට උතුරේ වවුනියා නගරය දක්වා වූ ප්‍රධාන සැපයුම් මාර්ගයේ, පිහිටා තිබේ. එයට එල්ල වූ ප්‍රහාරය කොලඹ තියුනු විවේචන ප්‍රහාරයක් අවුලුවාලී ය. එය ගුවන් හමුදාවට විශාල අලාභ හානියක් සිදු කලා පමනක් නොව, එයට අමතරව, එල්ටීටීඊයට එරෙහිව මිලිටරි ජයග්‍රහනයක් ලබා ගැනීම කල හැකි බවටත් එය සාපේක්ෂව ඉක්මනින් ලබා ගත හැකි බවටත් ආන්ඩුව ගෙන ගිය ප්‍රචාරය එම ප්‍රහාරය මගින් පුපුරුවා හරින ලදි.

සඳුදා ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල කියාපෑවේ එම්අයි-24 හෙලිකොප්ටර් දෙකකට හා පුහුනු වීමේ දී යොදා ගන්නා ගුවන් යානාවකට පමනක් හානි වූ බව යි. කඳවුරේ සිටි ආන්ඩුවේ හමුදාවන්ට සහාය පිනිස වවුනියාවේ සිට එහි ගිය තවත් හෙලිකොප්ටරයක් "කඩා වැටී" විනාශ විය. කෙසේ වෙතත්, සිදු වූ පාඩුවේ පරිමාව වසං කෙරෙතැයි ආන්ඩුව වහා ම විවේචනයට ලක් විය.

කඩා වැටුනු හෙලිකොප්ටරයට අමතරව, කඳවුරේ පිහිටි හෙලිකොප්ටර් තුනක්, පුහුනු වීමේ දී යොදා ගන්නා යානා හතරක් සහ සූක්ෂ්ම බීච්ක්‍රාෆ්ට් ඔත්තු බැලීමේ යානයක් විනාශයට ලක් වූ බව ඊයේ පාර්ලිමේන්තුවේ දී අගමැති රත්නසිරි වික්‍රමනායක පිලිගත්තේ ය. ප්‍රවෘත්ති වාර්තා ගනනාවක් ම යෝජනා කලේ, මිලිටරියේ ගුවන් යානා නාශක භටයන් කලබලයට පත්ව තවත් එල්ටීටීඊ ගුවන් යානයක් යැයි සිතා ගෙන "කඩා වැටුනු" හෙලිකොප්ටරයට වෙඩි තබා බිම හෙලූ බව යි.

ආන්ඩුව සත්‍යය වසං කරන්නේ නැතැයි වික්‍රමනායක ආරක්ෂාකාරී ආස්ථානයකින් ප්‍රකාශ කලේ ය. එහෙත් විනාශයට පත් වූ ගුවන් යානා ගනන සඳුදා සංඛ්‍යාවේ සිට ඉහල නැංගේ මන් ද යන්න පැහැදිලි කිරීමට ඔහු අසමත් විය. "අපට දේශපාලනය කරන්න රටක් තියෙන්න ඕනී" යැයි පවසමින් ආන්ඩුවේ යුද ප්‍රයත්නයට සහයෝගය දෙන ලෙස ඔහු සියලුම පක්ෂවලින් ඉල්ලා සිටියේ ය.

කඳවුරේ සිදුව ඇති හානිය මීට වඩා විශාල විය හැකි යැයි, බොහෝ සම්බන්ධතා සහිත ආරක්ෂක විශ්ලේෂක ඉක්බාල් අතාස් *හින්දුස්ථාන ටයිම්ස්* පත්‍රයට පැවසී ය. ප්‍රධාන නාවික ඔත්තු බැලීමේ ගුවන් යානයක් ඇතුලු යානා 12ත් 18ත් අතර සංඛ්‍යාවක් විනාශයට ලක්ව ඇතැයි ඔහු සඳහන් කලේ ය. බ්‍රිතාන්‍යයේ පාදක *ටෙලිග්‍රාප්* පුවත්පත තක්සේරු කලේ අලාභය එ.ජ. ඩොලර් මිලියන 40කට වැඩි බව යි. මිලිටරි වියදම් හේතු කොට ගෙන දැනටමත් අරමුදල් හිඟයකට මුහුන දී සිටින කොලඹ ආන්ඩුවට මෙය දැවැන්ත මුදලකි.

ප්‍රහාරයේ දී කඳවුරේ සිටි මිලිටරි භටයන් නව දෙනෙක් මරනයට පත්ව 20කට තුවාල සිදු විය. හෙලිකොප්ටරය කඩා වැටීමෙන් ගුවන් හමුදා භටයන් හතර දෙනෙක් මිය ගියේ ය. කාන්තා කේඩර්වරු තිදෙනෙකු ද ඇතුලු එල්ටීටීඊ මරා ගෙන මැරෙන භට කන්ඩායමේ සියලු ම සාමාජිකයෝ මිය ගියහ. එල්ටීටීඊයේ සැහැල්ලු ගුවන් යානා දෙක ඔවුන්ගේ කඳවුරු බලා ආපසු පැමිනියේ ය. මෙය එල්ටීටීඊය ආන්ඩුවේ හා මිලිටරි ඉලක්කයන්ට එල්ල කෙරුනු ප්‍රහාරවල දී තනි එන්ජිමේ සැහැල්ලු ගුවන් යානා යොදා ගත් හතර වන වතාව යි.

විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) එල්ටීටීඊය හෙලා දකින ගමන් ම කියා සිටියේ, "ආන්ඩුවේ නොතැකිම ආරක්ෂක හමුදා භටයන් අනතුරේ හෙලා ඇති" බව යි. මිලිටරියට එල්ටීටීඊ ගුවන් යානාවලට මුහුන දීම සඳහා අවශ්‍ය උපකරන සපයා නැතැයි ආන්ඩුව විවේචනයට ලක් කල එජාපය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ගුවන් හමුදාපති රොෂාන් ගුනතිලක ඉල්ලා අස්විය විය යුතු යැයි කියා සිටියේ ය.

එජාපයේ විවේචන ඔවුන්ගේ පූර්වාදර්ශනම්වල නිශ්චිත වෙනසක් පෙන්නුම් කරයි. එල්ටීටීඊය සමග 2002 සටන් විරාම ගිවිසුම අත්සන් කල පක්ෂය ලෙස, එජාපය, යලි ඇරඹූ යුද්ධයට සහාය දෙන අතර ම, වඩා පරෙස්සම් සහගත වන ලෙසත් සාම සාකච්ඡා යලි අරඹන ලෙසත් ආන්ඩුවෙන් ඉල්ලා තිබුනි. කෙසේ වෙතත්, වඩා මෑත දී එය පවත්නා සටන් විරාම ගිවිසුමට දුන් සිය සහයෝගය නිහඬව අතහැර දමා ආන්ඩුව පිලිබඳ සිය විවේචනවල දී වඩා යුද-ගැති තානයක් ගෙන තිබේ.

ඒ අතර ම, යලි යුද්ධය කරා යාම ආර්ථික ව්‍යසනයන් හා බොහෝ විට මිලිටරි ව්‍යසනයන් නිර්මානය කරනු ඇතැයි යන්න පිලිබඳව ගැඹුරින් ම උත්සුක වන ශ්‍රී ලංකා ව්‍යාපාරික කොටස්වල උත්සුකතා ද එජාපය තවමත් පිලිබිඹු කරයි. සිය මිලිටරි ජයග්‍රහන පිලිබඳව ආන්ඩුව දක්වන ජයෝන්මාදය පෙරලා පහර දීමට එල්ටීටීඊය සතු හැකියාව අඩු තක්සේරුවට ලක් කෙරෙතැයි, විශේෂයෙන් ම ආරක්ෂක විශ්ලේෂක අතාස්, වසරකට වැඩි කාලයක් තිස්සේ අනතුරු අඟවමින් සිටී.

ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) එල්ටීටීඊයට එරෙහිව පූර්න පරිමාන යුද්ධයක් පිලිබඳ සිය ඉල්ලීම යලි අවධාරනය කරනු වස් එල්ටීටීඊය ප්‍රහාරය ඩැහැ ගත්තේ ය. උතුරේ මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල එල්ටීටීඊ බල මධ්‍යස්ථානවලට එරෙහිව වහාම ආක්‍රමන දියත් කරන ලෙස ජවිපෙ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශ මිලිටරියෙන් ඉල්ලා සිටියේ ය. මිලිටරියේ ආරක්ෂාව ශක්තිමත් කරනු වස් තවත් මුදල් වැය කරන ලෙස ද ඔහු ඉල්ලා සිටියේ ය.

යුද්ධය උත්සන්න කිරීමේ ආන්ඩුවේ අධිෂ්ඨානය වෙනස් කිරීමට එල්ටීටීඊයේ ප්‍රහාරය සමත්ව නැත. ආන්ඩුව "ත්‍රස්තවාදය" නොඉවසන බවත් එය "මුලුමනින් ම තුරන් කරන තෙක්" සටන් කරන බවත්, යන්තම් දින දෙකකට පෙර පැවති රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී. ජනාධිපති මහින්ද රාජපක්ෂ යලිත් අවධාරනය කලේ ය.

එල්ටීටීඊ ප්‍රහාරයෙන් පසුව, රාජපක්ෂ අනුරාධපුරයේ ආරක්ෂාව ජෙනරාල් සනත් කරුනාරත්නගේ සමස්ත අනසක යටතට පත් කලේ ය. ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව. පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වානිජ ආරක්ෂක ඒජන්සි හා ඔත්තු සේවා ඒජන්සි අනුරාධපුරයේ ගෙන යන සියලු මෙහෙයුම් ඔහුගේ අනසක යටතට පත් කෙරෙනු ඇත. තථ්‍ය වසයෙන් ගත් කල, නගරය හා අවට ප්‍රදේශ මිලිටරි පාලනය යටතට පත් කරනු ලැබ ඇත.

ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, තමන්ට ඉල්ලා අස්වන ලෙස එජාපය කල ඉල්ලීම ප්‍රතික්ෂේප කලේ ය. "අනුරාධපුර කඳවුරට එල්ල වූ ප්‍රහාරය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට හා වන්නියේ පිහිටි ඔවුන්ගේ කඳවුරුවලට එරෙහිව සැලසුම් කෙරුනු මිලිටරි මෙහෙයුම්වලට කිසිදු අයුරකින් බාධා කරන්නේ නැතැ"යි ඔහු ආන්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පල කල නිවේදනයකින් මහජනතාවට සහතික විය. "ආරක්ෂක හමුදා අනතුරේ හෙලමින් දේශපාලන සෙල්ලමේ නොයෙදෙන" ලෙස ඔහු විපක්ෂයෙට තර්ජනාත්මක ලෙස අනතුරු ඇඟවී ය.

මිලිටරිය එල්ටීටීඊ ප්‍රහාරයට ප්‍රතිචාර දක්වා ඇත්තේ උතුරු ශ්‍රී ලංකාවේ එල්ටීටීඊ පාලන ප්‍රදේශවලට ගුවනින් පහර දීමෙනි. එල්ටීටීඊය සිය සැහැල්ලු ගුවන් යානා රඳවා ඇතැයි මිලිටරිය කියාපාන වන්නියේ ඉරනමඩු ප්‍රදේශයට ගුවන් හමුදාව විසින් ප්‍රහාර එල්ල කරන ලදි. අඟහරුවාදා, වවුනියාවේ ස්ථාන ගනනාවක දී එල්ටීටීඊ සටන්කරුවන් 12ක් ඝාතනයට ලක්ව ඇතැයි මිලිටරිය වාර්තා කලේ ය. බදාදා, මුලතිව් ප්‍රදේශයේ පිහිටි එල්ටීටීඊ පුහුන කඳවුරක් යැයි මිලිටරිය කියාපෑ ස්ථානයකට ගුවන් හමුදාව ජෙට් යානා බෝම්බ දැමී ය.

කෙසේ වෙතත්. සඳුදා ප්‍රහාරය මගින් පෙන්නුම් කෙරෙන්නේ, රට පුරා පිහිටි මිලිටරියේ හා ආන්ඩුවේ ඉලක්කවලට පහර දීමේ හැකියාව එල්ටීටීඊය සතුව තවමත් පවතින බව යි. ආන්ඩුව කිසිදු වග විභාගයක් නැතිව, දැනටමත් දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ පවතින යුද්ධයක් තුලට රට යලි ඇද දමා ඇති අතර එය නොවැලැක්විය හැකි ලෙස දිවයින පුරා වැඩ කරන ජනතාවට තවත් ජීවිත විනාශ, ව්‍යසනයන් හා කරදර ගෙන එනු ඇත.

© www.wsws.org